මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2021.01.23 |

# බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම්

බලපත්‍රලාභී බැංකුවල ලාභාංශ මුදලින් ගෙවීම් ඇතුළු අභිමතානුසාරී ගෙවීම් සම්බන්ධයෙන් විවිධ මත පළ වෙමින් පවතින වාතාවරණය සැලකිල්ලට ගනිමින් ඒ පිළිබඳ පහත පැහැදිලි කිරීම් සිදු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කර සිටී.

මීට පෙර, 2020 මැයි 13 වැනි දින නිකුත් කරන ලද විධානයක් මගින්, කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය සමඟ හටගත් සුවිශේෂී තත්ත්වයන් හමුවේ, බලපත්‍රලාභී බැංකුවල ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන මට්ටම් ශක්තිමත් කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකුවල ලාභාංශ මුදලින් ගෙවීම් ප්‍රකාශයට පත්කිරීම, ලාභ මෙරටින් බැහැර කිරීම, තම කොටස් ආපසු මිලට ගැනීම, කළමනාකාරිත්වය සඳහා ගෙවනු ලබන දීමනා වැඩි කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල වෙත කරනු ලබන ගෙවීම් ඉහළ දැමීම ආදී අභිමතානුසාරී ගෙවීම් 2020 දෙසැම්බර් 31 දින දක්වා සීමා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරන ලදී.

මෙම සීමා කිරීම් යලි සලකා බැලීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කටයුතු කළ අතර, ඒ අනුව, බලපත්‍රලාභී බැංකුවල 2020 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන විගණනයට ලක් කිරීමෙන් අනතුරු ව, ලාභාංශ මුදලින් ගෙවීමට සහ ලාභ මෙරටින් බැහැර කිරීමට 2021 ජනවාරි 19 වැනි දින නිකුත් කරන ලද විධානය මගින් බලපත්‍රලාභී බැංකු වෙත අවසර ලබා දුනි.

බලපත්‍රලාභී බැංකු විසින් මෙලෙස ලාභාංශ මුදලින් ගෙවීමේ දී සහ ලාභ මෙරටින් බැහැර කිරීමට තීරණය කිරීමේ දී, පවතින අභියෝගාත්මක වාතාවරණයන් හමුවේ බැංකුවල වත්කම්වල වර්ධනය, ව්‍යාපාර පුළුල් කිරීම සහ කොවිඩ්-19 වසංගතය නිසා වන බලපෑම වැනි දෑ පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.

තව ද, බලපත්‍රලාභී බැංකු විසින් 2021 ජූනි 30 දින දක්වා කාලය තුළ සිය කොටස් ආපසු මිලදී ගැනීම් සහ අත්‍යවශ්‍ය නො වන වියදම් සිදු කිරීමෙන් වැලකී සිටිය යුතු අතර, ප්‍රාග්ධන වියදම් සිදු කිරීමේ දී ඉතා විචක්ෂණශීලී ව සහ නිසි සැලකිල්ලෙන් කටයුතු කළ යුතු ය.